5 - සංස්කෘතික අවබෝධය,මාධ්‍යයේ ස්වභාවය හා එහි බලපෑම

1. 1. "සංස්කෘතිය යනු අංග රැසක එකතුවකි." මැලිනොවුස්කි නැමති මානව විද්‍යාඥයාගේ අර්ථකථනයට අනුව සංස්කෘතියක අන්තර්ගත මූලික අංග 4ක් නම් කරන්න.
   2.ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ දෙකක් කෙටියෙන් හඳුන්වන්න.
   3.මාධ්‍ය සංස්කෘතිය හේතුවෙන් සමාජයේ ඇතිවිය හැකි වෙනස්කම් 4ක් නම් කර ඉන් දෙකක් විග්‍රහ කරන්න.
   4.ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ජන සන්නිවේදන ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් 4ක් පදනම් කර ගෙන රචනයක් ලියන්න.

2. 1.සංස්කෘතිය පිළිබඳ එඩ්වඩ් ටයිලර්ගේ නිර්වචනයෙහි අන්තර්ගත කරුණු 4ක් නම් කරන්න.
   2.ගෝලීයකරණය සමාජය මත ඇති කරන බලපෑම පිළිබඳ කරුණු 2ක් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.
   3."ජනප්‍රිය සස්කෘතිය සමාජ පරිහානිය කෙරෙහිද බලපෑ හැකිය."මෙම අදහසට පක්ෂව කරුණු තුනක් ඇසුරින් විවරණයක් කරන්න.
   4.රූපවාහිනියේ ප්‍රචාරය වන කිරිපිටි දැන්වීම් මගින් පාරිභෝගිකයාට සිදුවිය හැකි බලපෑම පිළිබඳව කරුණු 4ක් ඇසුරින් විස්තරයක් කරන්න.